# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2094/39 - 2018 ඔක්තෝබර් මස 26 වැනි සිකුරාදා - 2018.10.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : KDS/PHT/4/1/3/69.

*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමා. යොමු අංකය* : 4-3/9/2015/WS/51.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම් දහය කෝරළේ සුළු කොට්ඨාසයේ, කඳාකුල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2018.07.31 දිනැතිව මැන සකස් කරන ලද, අංක මහ 6808 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දක්වෙන "නාරංකඩුව වත්ත" නැමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0539ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස;

කැබලි අංක 01 - **ඉඩමේ නම: නාරංකඩුව වත්ත; හිමිකම් කියන අයගේ නම හා ලිපිනය: බී. ජී. වර්ණකුලසූරිය, අංක 145, කඳාකුල, තලතුඔය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0539;**

මායිම් :

*උතුරට:* එල්.ඒ.ඩී.කේ.ගුණතිලක හිමිකම් කියන නාරංකඩුව වත්ත සහ ඩබ්ලිව්.එස්.එම්. රම්බණ්ඩා හිමිකම් කියන මුතුවා වෙදාගේ ඉඩම; *නැගෙනහිරට:* ඩබ්ලිව්.එස්.එම්. රම්බණ්ඩා හිමිකම් කියන මුතුවා වෙදාගේ ඉඩම; *දකුණට:* පුංචිරාල වෙදරාල හිමිකම් කියන බටපඳුරේ හේන සහ පාතහේවාහැට ප්‍රාදේශීය සභාව හිමිකම් කියන නාරංකඩුව වත්ත; *බටහිරට:* පාතහේවාහැට ප්‍රාදේශීය සභාව හිමිකම් කියන නාරංකඩුව වත්ත සහ මාර්ගය.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 නොවැම්බර් මස 26 වැනි දින පෙ.ව. 10.00ට පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2018 නොවැම්බර් මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක්

සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

මධුපානි පියසේන,
ප්‍රාදේශීය ලේකම්,
පාතහේවාහැට.

2018 ඔක්තෝබර් මස 18 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-456

---

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : KEG/LAN/AQUIS/A3/1/106.

*ඉඩම් අමා. අංකය* : 4-3/15/2016/VE/240.

කැගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2016 නායයාමෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම පාරඹේවත්ත බොස්සැල්ල කොටස නැමති ඉඩම අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි අත්පත් කරගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

සබරගමුව පළාතේ කැගල්ල දිස්ත්‍රික්කයේ කැගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 57 බී දරණ බොස්සැල්ල ග්‍රාම නිලධාරි වසමේ බොස්සැල්ල ගම තුළ පිහිටි කැගල්ල මැනුම් අධිකාරිගේ අංක මු.පි.කැ. 3575 දරණ මූලික පිඹුරේ අමුණා ඇති උප ලේඛනයේ සඳහන් ඉඩම් කැබලි 10ක් වේ.

වන්දි හිමිකම් පරීක්ෂණ දින:
මු.පි.කැ. 3575 පිඹුරේ කැ. අංක 01 සිට 10 සඳහා 2018 නොවැම්බර් මස 19 වෙනි දින පෙ.ව. 9.30 ට

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ ඉහත සඳහන් දිනයන්හි හා වේලාවන්හිදී කැගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2018 නොවැම්බර් මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම අත්පත් කරගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ. ජී. එස්. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කැගල්ල.

2018 ඔක්තෝබර් මස 22 වැනි දින,
කැගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

**මු.පි.කැ. 3575 පිඹුරේ**

| | | |
|---|---|---|
| කැබලි අංකය | : | 01 සිට 10 දක්වා |
| ප්‍රමාණය | : | හෙක්ටයාර් 1.8759 |
| ඉඩමේ නම | : | පාරඹේවත්ත (බොස්සැල්ල කොටස) |
| හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය | : | 01 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, කොළඹ<br>02 කළමණාකරණ අධ්‍යක්ෂ, කැගල්ල වැවිලි සමාගම, අංක 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම |

11-457